# ස්වයං අධ්‍යයනයට අත්වැලක්

ශ්‍රේණිය - 06 ශ්‍රේණිය

වාරය - දෙවන වාරය

නිපුණතා මට්ටම - 3.1.1. සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම

## සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමු.




සැකසුම - එච්.ඩී.ගයානි සාගරිකා

මප/වත්/වත්තේගම ම.ම.වි.

මෙහෙයවීම - නර්තන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය

වත්තේගම

උපදෙස් - *මෙය ලිඛිත පාඩමකි. මෙම පාඩම වැඩිදුරටත් අධ්‍යයනය කිරීම සඳහා පාසලේ ගුරු ඇසුර ලබාගත යුතුය.*

## හැඳින්වීම.

ලංකාවේ ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් තුනකි. එනම් උඩරට,පහතරට,සබරගමු නර්තන සම්ප්‍රදායන්ය. මෙම නර්තන සම්ප්‍රදායන් තාලය මත පිහිටා නිර්මාණය වී ඇති බව පැහැදිලි කරුණකි. නර්තනයේදී තාලය තබා ගැනීමට යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ රාශියකි.

ඔබ මේ වන විට විවිධ අවස්ථාවලදී වාද්‍ය භාණ්ඩ දැක ඇත. එම වාද්‍ය භාණ්ඩ විවිධ හැඩයෙන් නිර්මාණය වී තිබේ. වාදනය කරන ආකාරයද එකිනෙකට වෙනස්ය. වාද්‍ය භාණ්ඩවලින් නිකුත් වන හඬෙහිද විවිධත්වයක් පවතී. එම වාද්‍ය භාණ්ඩ විශේෂ නම්වලින් හඳුන්වයි.

මෙම වාද්‍ය භාණ්ඩ **සාම්ප්‍රදායික හා විකල්ප වාද්‍ය භාණ්ඩ** වශයෙන් වෙන්කර හඳුනාගත හැකි අතර ඒ පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් කිරීමට බලාපොරොත්තු වෙමි.

# සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හඳුනා ගනිමු

ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය ඇතුළුව ලංකාවේ ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් තුනකි. මෙම සම්ප්‍රදායන්ට (උඩරට,පහතරට,සබරගමු) අයත් වාද්‍ය භාණ්ඩ අප හඳුන්වන්නේ **සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ** ලෙසිනි. මේවා ඉතා සුවිශේෂී වේ.

## 01. ගැටබෙරය





- උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වේ.
- පංචතූර්ය වාදනයේදී 'ආතත' (අතින් වාදනය කරන) ඝනයට අයත් වේ.
- බෙරකඳ දෙපසට වඩා මැද කොටස විශාලය. එය ගැටයක් ලෙස මතු කිරීම නිසා 'ගැටබෙරය' ලෙස නාමය ලැබී ඇත.
- උඩරට ප්‍රදේශවල ප්‍රචලිත උඩරට නැටුමට වාදනය කල බෙරය නිසා උඩරට බෙරය ලෙස හැඳින්වේ.
- උඩරට ප්‍රදේශවල මංගල කටයුතු, සුභ කටයුතු වලදී මූලිකව වාදනය කරන නිසා මගුල් බෙරය ලෙසත් හඳුන්වනු ලැබේ.

### 02. දෙවොල් බෙරය






- පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වේ.
- පංචතූර්ය වාදනයේදී 'ආතත' ඝනයට අයත් වේ.
- පහතරට බෙරය ලෙස හඳුන්වන්නේ පහතරට ප්‍රධාන වාද්‍ය භාණ්ඩය නිසාවෙනි.
- පහතරට ප්‍රධාන ශාන්තිකර්මයක් වන දෙවොල් මඩුවේ වාදනය කරන නිසා **දෙවොල් බෙරය** ලෙස නම් ලබයි.
- බුදුන් වහන්සේ, දෙවියන් මෙන්ම යකුන් වෙනුවෙන් වාදනය කරන නිසා **යක් බෙරය** ලෙසද හැඳින්වේ.
- අනෙක් බෙර වලට වඩා දික්ව පෙනෙන නිසා **දික් බෙරය** යනුවෙන්ද හඳුන්වයි.
- අනෙක් බෙර වලට වඩා ගිගුම් දෙන හඬක් නැගෙන නිසා **ඝෝෂක බෙරය** ලෙසද හැඳින්වේ.

### 03. දවුල





- සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වේ.
- පංචතූර්ය වාදනයේදී 'විතතාතත' (අතින් සහ උපකරණයක් භාවිතයෙන් වාදනය කරන) ඝනයට අයත් වන එකම සුවිශේෂී වාද්‍ය භාණ්ඩයයි.
- මෙහි සහයට යොදාගන්නා වාදන උපකරණය **කඩිප්පුව** යන නමින් හැඳින්වේ.
- ලංකාව පුරාම හේවිසි වාදනයේදී දැකගත හැකිය.

### 04. තම්මැට්ටම




- තම්මැට්ටම කොටස් දෙකකින් (අසමාන බෑ දෙකකින්) සමන්විතය.
- එම කොටස් දෙක හඩ බෑය සහ මණ්ඩම ලෙස හැඳින්වේ.
- පොකුරක් සේ එකිනෙක ලංව දැකිය හැකි නිසා **පොකුරු බෙරය** යන නාමයෙන් ද හඳුන්වයි.
- මෙය විතත වර්ගයට (කඩිප්පු දෙකකින් වාදනය කිරීම) අයත් වේ.
- හේවිසි වාදනයට යොදා ගන්නා නිසා ලංකාව පුරාම දැකිය හැකි වාද්‍ය භාණ්ඩයකි.

### 05. උඩැක්කිය




- සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ අතර ඉතා කුඩාම වාද්‍ය භාණ්ඩය මෙයයි.
- පංචතූර්ය වාදනයේදී 'ආතත' ඝනයට අයත් වේ.
- උඩරට නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩයකි.
- මෙම උඩැක්කිය '**සිරිවස**' යන නමින් හඳුන්වයි.

### 06. රබාන





- මෙම වාද්‍ය භාණ්ඩයේ ඇත්තේ එක් මුහුණතකි.
- ඒ නිසා රබාන **'එකැස් බෙරය'** යනුවෙන් හඳුන්වයි.
- නර්තනය සමඟ වාදනය කරන මෙය අත් රබානයි.
- පංචතූර්ය වාදනයේදී 'ආතත' ඝනයට අයත් වේ.

### 07. තාලම්පට







- දේශීය නර්තන සම්ප්‍රදායේ තාල තැබීමට යොදා ගනු ලබන වාදන භාණ්ඩය තාලම්පටයි.
- ලෝහයෙන් කළ පියන්පත් දෙකකින් යුතු නිසා එකිනෙක ගැටීමෙන් හඬ උපදවන නිසා පංචතූර්ය වාදනයේදී 'ඝන' වාදන උපකරණයක් ලෙස හඳුන්වයි.
- තාලම්පටින් උපදින ප්‍රධාන හඬ දෙකකි. පියන් දෙක එකට වැසු විට **තිත්** ශබ්දයත් පියන් දෙක එකිනෙක වැදී ලිස්සා යන ලෙස වාදනය කිරීමෙන් **තෙයි** ශබ්දයත් නැගෙයි.

## 08. හොරණෑව





- මෙය නළා විශේෂයකි.
- පංචතූර්ය වාදනයේ 'සුසිර' (සුළගේ ආධාරයෙන් වාදනය කරන) කොටසට අයත් වේ.
- හොරණෑව වාදනය කිරීම අසීරු කටයුත්තකි.
- ලීයෙන්, පිත්තලවලින්, හරක් අඟෙන් මෙය නිමවා ඇත.
- මෙම වාදන භාණ්ඩය බෞද්ධ ආගමික සිද්ධස්ථානවලදී පෙරහැරවලදී වාදනය කරයි.

මේ ආකාරයෙන් සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ පිළිබඳ ඔබට අවබෝධ වන්නට ඇතැයි සිතමි. වාදන භාණ්ඩයක නිපදවෙන ශබ්දය (ධ්වනිය) එකිනෙකට වෙනස් වෙයි. වාදනයට ඇහුම්කන් දීමෙන් එය අවබෝධ කර ගත යුතුවේ. මෙම වාද්‍ය භාණ්ඩවලින් නිපදවෙන අක්ෂර විවිධය මෙම අක්ෂර වාදනය කිරීමෙන් උපදින නාදය නර්තනයේදී විශාල භාෂාවක් බවට පත්වෙයි. එසේ වන්නේ මෙම වාදන භාණ්ඩ මනාව සැකසීම නිසාවෙනි.



### බෙර නිර්මාණය

- සුවිශේෂී දැව වර්ග භාවිතා කරයි.
- සමින් (සත්ව හම් වර්ග) නිර්මාණය කර ඇත.
- නිශ්චිත දිගකින් හා පළලකින් යුක්තය.

මේ ආකාරයෙන් සම්මත ක්‍රම ශිල්ප අනුගමනය කරයි.

### බෙර නිර්මාණය හා සබැඳි චාරිත්‍ර

- ප්‍රථමයෙන් සුදුසු ගසක් තෝරා ගැනීම.
- පෙර දින ගස මුල පිරිසිදු කිරීම.
- ගස වටා මල්පැල සතරක් සාදා ගොප් රැහැන් ඇඳ කහ දියර ඉසීම.
- සුවඳ දුම් අල්ලා මල් පහන් පූජා කිරීම.
- ගසට අරක්ගත් දෙවියන්ට ඉවත් වන ලෙස කන්නලවු කිරීම, දෙවියන්ගේ අවසර ගැනීම.
- පසු දින, ගසට නමස්කාර කොට ගස කැපීම - එහිදී සුභ වේලාවක් (නැකතක්) භාවිතා කරයි.

මේ ආකාරයෙන් සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ නිර්මාණය ආරම්භයේ පටන් ඉතා භක්තිමත්ව කටයුතු කිරීමටද පැරැන්නන් වග බලා ගත් බව ඔබ දැන ගත යුතුය. බෙරයේ හඬ හොඳින් මතු කිරීමට බෙර නිර්මාණ ශිල්පියා විශාල කාර්යභාරයක් සිදු කරයි.

## සාම්ප්‍රදායික වාදන භාණ්ඩ වාදන අවස්ථා



- **ගැටබෙරය/යක් බෙරය**
  - ආගමික අවස්ථා : ආගමික උත්සව (පන්සල්,විහාර,දේවාල)
    පෙරහැර අවස්ථා
  - සමාජීය අවස්ථා : ශාන්තිකර්ම
    සමාජ උත්සව
    සමාරම්භක උත්සව
    තූර්යවාදක කණ්ඩායම්





- **දවුල/තම්මැට්ටම/හොරණෑව**
  - ආගමික අවස්ථා : තේවා හේවිසි වාදනයට යොදා ගනි.
    පෙරහැර අවස්ථාවලදී
  - සමාජීය අවස්ථා : දානමය පිංකම් සඳහා
    සංඝ රත්නය වැඩමවීමේදී
    අවමංගල්‍යය කටයුතු උදෙසා



- **රබාන**
  - ආගමික අවස්ථා : පෙරහැර අවස්ථාවලදී
  - සමාජීය අවස්ථා : සමාජ උත්සව කටයුතුවලදී

- **උඩැක්කිය**
  - ආගමික අවස්ථා : පෙරහැර අවස්ථා
    ජන නාටකවලදී
    ශාන්තිකර්මවලදී
  - සමාජීය අවස්ථා : පාසැල් විවිධ උත්සව
    පෙරදිග තූර්යවාදක කණ්ඩායම්



- **තාලම්පට**
  - ආගමික, සමාජීය සියලු අවස්ථාවල නර්තනය,ගායනය,වාදනය සඳහා තාල තැබීමේදී මෙය වාදනය කරයි. තාලම්පට තාල වාද්‍ය භාණ්ඩයක් පමණක්ම නොව මෙය වාදනය කරමින් නර්තනයේ යෙදෙන විට තාලම් නැටුම බවට ද පත් වේ.

**මෙවැනි නිර්මාණ පිළිබඳ අධ්‍යයනය කරන අතරතුර ඔබත් නිර්මාණකරණයට පෙළඹිය යුතුය. එහිදී ඔබට ඔබේ පරිසරය සහාය කර ගත හැකිය.**

## විකල්ප වාද්‍ය උපකරණ

ඉගෙන ගන්නා දරුවන් වශයෙන්, පරිසරයෙන් ලබාගත් අමුද්‍රව්‍ය තුලින් විවිධ ආකාරයේ ශබ්ද,නාද මතු කරන වාදන භාණ්ඩ ඔබටද නිර්මාණය කරගත හැකිය. එසේ නිර්මාණය වන වාද්‍ය උපකරණ **"විකල්ප වාද්‍ය උපකරණ"** ලෙස හඳුන්වමු.

* **පරිසරයෙන් ලබාගත් ද්‍රව්‍ය උපයෝගී කරගෙන තාල වාද්‍ය භාණ්ඩ** (දෑත් හා උපකරණ යොදා ගෙන තට්ටු කිරීමෙන්, තෙරපීමෙන් හඬ උපදවා ගැනීම) නිර්මාණය කරගත හැකිය.

උදාහරණ : එක්ස්රේ රබාන

ටින් බෙරය

දඬු බෙරය

ටොනික් පියන් වළල්ල



* **පරිසරයෙන් ලබාගත් ද්‍රව්‍ය උපයෝගී කරගෙන සුසර වාද්‍ය භාණ්ඩ** (සුළං මගින් හඬ උපදවන) නිර්මාණය කළ හැකිය.

උදාහරණ : ගස්ලබු බටනළාව

ගොප් කොළ නළාව

පනා නළාව



## විකල්ප වාද්‍ය උපකරණවලින් හඬ උපදවා ගැනීමට භාවිතා කල හැකි විවිධ ක්‍රම සහ අමුද්‍රව්‍ය









- **ඇතිල්ලීමෙන්**
  - ✓ ටින් පියන්පත්
  - ✓ ගල් දෙකක්
  - ✓ ටින් එකක්
  - ✓ රිජිෆෝම් කැබලි දෙකක්

- **සෙලවීමෙන්**
  - ✓ ටින් එකට ගල් දැමීම
  - ✓ ටින් එකට වැලි දැමීම
  - ✓ එක්ස්රේ කොළය
  - ✓ පොලිතින් බෑග්
  - ✓ ටොනික් පියන් වළල්ල

- **තට්ටු කිරීමෙන්**
  - ✓ ලී දෙකක්
  - ✓ එක්ස්රේ කොළය
  - ✓ කාඩ්බෝඩ් පෙට්ටිය
  - ✓ ප්ලාස්ටික් කෑන්

- **තැළීම**
  - ✓ කුඩා වීදුරු බෝතල්වලට විවිධ ප්‍රමාණයට ජලය දමා ලෝහ කූරකින් තට්ටු කිරීම.

- **පිඹීමෙන්**
  - ✓ ගස්ලබු දණ්ඩේ මුල් කෙළවරට ඉනියක් දමා පිඹීම.
  - ✓ එස්ලෝන් බටනළාව.
  - ✓ ගස්වල කොළවලින් නළා සැකසීම.



## විකල්ප වාද්‍ය උපකරණ වාදන අවස්ථා

- පාසලේ උත්සවවල සමූහ වාදන අවස්ථා.
- පෙරහැර අවස්ථා
- විවිධ නර්තනවලදී, නාට්‍යමය අවස්ථාවලදී සහය වාදනය සඳහා.

